# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ඉහළ දිස්ත්‍රික්කයේ නාවලපිටිය අංගනයේ චෙක්රේල්ඩ් (Check Railed) දුම්රිය මාර්ගය සඳහා EN 45 E1 පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර් 4,000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය - IFB අංක - SRS F. 7899

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඉහළ දිස්ත්‍රික්කයේ නාවලපිටිය අංගනයේ චෙක් රේල්ඩ් දුම්රිය මාර්ගය සඳහා EN 45 E1 පීලිවලට ගැළපෙන අඩු උස කොන්ක්‍රීට් සිල්පර 4,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින් / සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
3. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට 2023-01-27 දින සිට 2023-02-22 දින තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල දිනයන්හිදී පහත ලිපිනයෙන් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

   නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)
   දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
   ඕල්කොට් මාවත, කොළඹ - 10, ශ්‍රී ලංකාව.
   දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
   ෆැක්ස් අංකය : 94 (11) 2432044
   ඊමේල් : srs.slr@gmail.com
   වෙබ් අඩවිය : www.railway.gov.lk

4. ලංසුකරු පසුගිය වසර පහ (05) ඇතුළත ශ්‍රී ලංකා දුම්රිය සේවයට කොන්ක්‍රීට් සිල්පර 5,000 කට වැඩි සංඛ්‍යාවක් සපයා තිබීම හෝ රු. මිලියන 50 කට වැඩි අගයක පෙර ගැන්වූ කොන්ක්‍රීට් බාල්ක සපයා තිබියයුතු හෝ රු. මිලියන 500 කට වැඩි අගයකට පෙර සවිගැන්වූ කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතු අතර, ඉන්වොයිස් පත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.
5. කොළඹ - 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 30,500/- ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2023-01-27 දින සිට 2023-02-22 දින ප.ව. 3.00 තෙක් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.
6. සෑම ලංසුවක් සමගම ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 1,700,000.00 ක් විය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
7. ලංසු 2023-02-23 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

   සභාපති,
   දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,
   ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,
   ශ්‍රී ලංකා දුම්රිය සේවය,
   ඕල්කොට් මාවත, කොළඹ - 10.

**යොමු අංකය : SRS/F.7899**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**